IHRA
UNIVERSITY OF COLOMBO

# මානව සම්පත් අභිවර්ධන ආයතනය - කොළඹ විශ්වවිද්‍යාලය

## මත්ද්‍රව්‍ය දුර්භාවිත කළමනාකරණ අධ්‍යයන ඩිප්ලෝමා පාඨමාලා අංක 09

## ප්‍රථම සෙමෙස්තර පරීක්ෂණය

(පවත්වන ලද්දේ 2019 නොවැම්බර්)

## DDAMS 1002 – මත්ද්‍රව්‍ය නිවාරණය

උපදෙස්

(1) පහත දක්වා ඇති උපදෙස් පිළිපදිමින් ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

(2) කාලය පැ තුනයි (03).

(3) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හයකින් (06) හා පිටු එකකින් (01) සමන්විත වේ.

(4) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(5) විභාගය අවසානයේදී සියලුම පිළිතුරු පත්‍ර එකට ගැට ගැසිය යුතුය.

(6) ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්නයක් හෝ පිටුවක් මුද්‍රණය වී නොමැති නම් ඒ බව වහාම ශාලාධිපති වෙත දැනුම් දෙන්න.

01.

i. සෞඛ්‍ය ප්‍රවර්ධනය අර්ථ දක්වන්න.

(ලකුණු 05)

ii. සෞඛ්‍ය දියුණුකිරීමේ සාමාන්‍ය වැඩපිළිවෙලකට වඩා සෞඛ්‍ය ප්‍රවර්ධන යොමුවෙහි ඇති විශේෂතා ඔබගේ අර්ථ දැක්වීම ඇසුරෙන් විස්තර කරන්න.

(ලකුණු 15)
(මුළු ලකුණු 20)

02.

i. සෞඛ්‍ය ප්‍රවර්ධනය අර්ථ දක්වන්න.

(ලකුණු 05)

ii. සෞඛ්‍ය ප්‍රවර්ධනය මූලධර්ම වලට අනුව පාසලක හෝ ගමක මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහනක් දියත් කිරීමට ඔබට වසර 1 ක කාලයක් ලබා දුන්නේ නම්, එම වැඩසටහනේදී ඔබ අනුගමනය කරන පියවරයන් ආරම්භයේ සිට අවසානය දක්වා විස්තරාත්මකව පැහැදිලි කරන්න.

(ලකුණු 15)

(මුළු ලකුණු 20)

03. සෞඛ්‍යමත්ව ජීවත්වීම යනු ලෙඩක් නැතිව සිටීම නොව ඊට වඩා බෙහෙවින් පුළුල් සංකල්පයකි. සෞඛ්‍ය සහ යහ පැවැත්ම යන්නෙහි මූලික අංග විස්තර කර සෞඛ්‍ය ප්‍රවර්ධන යොමුව අර්ථදක්වමින් ඉහත ප්‍රකාශ පිළිබඳ පැහැදිලි කිරීමක් කරන්න.

(ලකුණු 20)

04. මත්ද්‍රව්‍ය භාවිතය ප්‍රවර්ධනය වීමට බලපාන ප්‍රධාන සාධක විස්තරාත්මකව ඉදිරිපත් කරන්න.

(ලකුණු 20)

05. මත්ද්‍රව්‍ය නිවාරණ ක්‍රියාකාරකම් සැලසුම් කිරීමේදී අවධානය යොමු කල යුතු ප්‍රධාන අංශ විස්තරාත්මකව ඉදිරිපත් කරන්න.

(ලකුණු 20)

06. මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමෙන් පසු ප්‍රජාවක් තුළ ඇතිවිය හැකි ප්‍රධාන වෙනස්කම් මොනවාදැයි උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 20)

*******